# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2148/17 – 2019 නොවැම්බර් 05 වැනි අඟහරුවාදා – 2019.11.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2018/223.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන් :*

තිලක් සුමින්ද මයා ඇතුළු සේවකයින් 07 දෙනා,
765/369, බෝධිරාජ මාවත,
මාලිගාවත්ත.

*අනෙක් පාර්ශවය වශයෙන් :*

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී. එල්. සී,
181/ 1 ඒ, ධර්මපාල මාවත,
කොළඹ 07.

1A – G 31417– 11(2019/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවින්ද්‍ර සමරවීර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්,

කටුගස්තොට,
යටිවැවල,
අරලිය උයන,
''මිගදාය'',
339/01/D 02, එල්. ආර්. සුමතිපාල මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**රවින්ද්‍ර සමරවීර,**
කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය.

2019 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2018/223.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

එක් පාර්ශවයක් වශයෙන්,

තිලක් සුමින්ද මයා ඇතුළු සේවකයින් 07 දෙනා,
765/369, බෝධිරාජ මාවත,
මාලිගාවත්ත.

අනෙක් පාර්ශවය වශයෙන් :

සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී. එල්. සී,
181/ 1 ඒ, ධර්මපාල මාවත,
කොළඹ 07.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,

''සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆයිනෑන්ස් (පී. එල්. සී) සමාගම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවරා ගෙන ගණන් බේරා වසා දැමීමට කටයුතු කිරීමේ දී තිලක් සුමින්ද මහතා ඇතුළු පහත නම් සඳහන් සේවකයින් 07 දෙනාගේ සේවය අවසන් වීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු වී ඇත් ද? යන්න හා එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔවුන්ට හිමි විය යුතු සහනයන් කවරේද? '' යන්න පිළිබඳව වේ:

1. තිලක් සුමින්ද මයා
2. ඩී. එම්. ධම්මිකා දිසානායක මිය
3. උදානි පබසරා මතගවීර මෙය
4. එම්. නිශාන්ත මයා
5. කේ. ඒ. නිලුක්ෂි චාමරි මිය
6. රේණුකා දහනායක මිය
7. සමන්ත නන්දිරත්න මයා

**ඒ. විමලවීර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 සැප්තැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

11 - 1303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.